




**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තෝරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## මුහුණු පොතේ හිම කුමරී

**රූපයක් ගැට ගහලා තිබුණා**
**සාදයක් වෙලාවකදී ගත්ත**
**කංසා මල් පෙත්තක් වාගේ**
**කවරයේ ඇය පින්බර ය**
**මුහුණු පොත රෑට**
**කාත් කවුරුවත් නැති ලෝකෙක**
**අඳුරු වනපෙතක සිරියහන ය**

**හිම වැටෙන තරු එළි වැටෙන් පැන**
**මද කිපුණු කවි පද**
**දෙපා පැටලිපැටලි**
**ඇවිදගෙන එයි හදිසියට**
**අකුරු අඩු වූයේ හාදුවට**
**සුළඟ වැඩිකමට ද**
**මායිමේ හේමන්ත ඉරිතුවට**

**කවුළුවෙන් වැටෙන පිනි කැටවලට**
**හිරිගඬු පිපෙනවා නේ ද හීතලට**
**නටුවේ ගැට ලිහා වැටෙන**
**ඇපල් කොළවල සද්දෙට**
**කඳුළු ඇවිදින් ඔන්න ඇස්වලට**
**ගුළිවෙලා උන්නු මෙන්න මේ කවියට**
**තනපටක් ලිහාපන් ළංවෙලා පපුවට**
**ගවු ගණන් ලිහා ඇවිදින්**
**මකුළු දැලක හරස්කඩක් තරමට**

**මුවින් මුව ගැටෙන කවිපද**
**රුවින් රුව නො දැක**
**ඇස් බැඳන් දෙන හාදුව සුන්දර ය**
**හැඟුම්බර වදන් විටෙක**
**රමණයට මුහුණු පොත කදිම ය**

**ඉතිං උඹ නෑවිත් ඉඳින්**
**ඇඟිලි තුඩු අතරට අහුවෙන්න**
**හෙටින් ඇරඹෙන දවසත්**
**තුඩින් තුඩ ගෙන වළඳන්ට**
**ළඟින් ඉන්න ම ඕනෙ ද**

ඩොමිනික් චන්ද්‍රසාලි
(ගාලු පාර දිග හැලුණ සිනා සළු' කාව්‍ය සංග්‍රහය - 2014)

මනඃකල්පිත අභූත අතථ්‍ය මානව සබඳතා දිග්ගැස්සි දිග්ගැස්සී යථාවක්ම බවට පත්වී සුරතාන්තයක් දක්වා ගමන් කොට නිවී සැනහෙන්නට හැකි අවකාශයක් ඇත්නම් ඒ අනෙකක් නොව, 'මුහුණුපොත' නමින් සැවොම හඳුන්වන 'ෆේස්බුකිය' වේ. නමින් මුහුණුපොත වූවද, මුහුණු රහිතවුන්ටම තැනූ සාවියක් බඳු එවැන්නක් ඇසුරේ අපේ ජීවිත, අපේ අවිඥානගත සිතිවිලි හෝ අපේම අශ්ලීලත්වය අපේම ආකරයටකට අපේම වූ ගනුදෙනුවක යෙදෙන හැටි විටෙක පුදුම සහගතය. අපි මීට දශකයකට කලින් එවැන්නක් සිහිනෙනුදු නොදුටු නමුදු දැන් එය තථ්‍ය මානව සබඳාවන්ටත් එහාට ගිය අපේම ජීවිත හා අනන්‍යව ඇලුණු යථාවක්ම බවට පත්වී ඇත. ඉදින් මෙන්න මේ අවකාශය ඇසුරේ අපේ අවිඥානය අපව හසුරවන අයුරු, එනම් වර්ථමානයේ බොහෝ දෙනෙක් මේ අවකාශය ඔස්සේ හැසිරවෙන අයුරු අපූර්වත්වයකින් කවියකට නැඟුණු මොහොතකි, ඩොමිනික්ගේ මේ කවිය.

අපට අපේම අඳුරත් එක්ක එළියේ ගනුදෙනු කිරීම ඉතා අසීරුය. ඉදින් ඊට ගැලපෙන අන්ධකාරය පිරි ගුහා පරිසරයක් ඒ වෙනුවෙන්ම සොයා ගත යුතුය. සොයාගනු බැරි නම් එවැන්නක් තනා ගත යුතුය. සකර්බර්ග්ගේ පිහිටෙන් මෙන්න මේ අඳුරු වේදිකාව සැවොම වෙනුවෙන් තැනී හමාරය. ඉතින් මේ අඳුරේ අතපත ගෑම එළිය විඳීමකටත් එහා ගිය ප්‍රහර්ෂයක් අපට ලබා දෙන්නට හැකි තරමටම ප්‍රබල වී හමාරය.

දැන් අපි කවිය දෙසට හැරෙමු. එය ඇරඹෙන්නේ 'මුහුණු පොතේ හිම කුමරී' යන මාතෘකාවකිනි. සැබෑ ජීවිතය තුළ එවන් සුරූපී හිම කුමරියන් හිඳීද? හිඳී නම් ඒ මොන වගේද යන කුකුසත් එක්කම 'මුහුණුපොත' නම් මේ වපසරිය තුළ නම් ඔවුන් බහුලව සිටින බව තහවුරු කරමින් කවිය කියවන අපවත් ඒ මනඃකල්පිත අවකාශයට ක්ෂණිකව ඇද දමන්නට ඩොමිනික් සමත් වේ. යෞවනියන් වඩාත්ම සුරූපීව දිලෙන්නේ සාදයකට යාමට සූදානම් වන විට බව අපි දනිමු. තියෙන ඉස්තරම්ම ඇඳුම් පැළඳුම්, ආභරණ හා අංගෝපාංග සමග ඔවුහු දෙව්ලොව සවාරියක් යෑමට මෙන් එවැනි අවස්ථාවල ලක ලැහැස්ති වෙති. මේ කවියේ කියැවෙන, අප කවියාගේ අඳුරු ගුහා ගත 'දුර' ජීවිතය අත් පසුරෙන් ගත් හිම කුමරියත් ඊට නොදෙවෙනිය. ඇයත් ඇගේ ෆේස්බුක් ප්‍රොෆයිලයේ පින්තූරය සකසා තිබුණේ එවැනිම සාදයක් වෙලාවක අරගත්ත අති සුන්දර ඡායාරූපයකිනි. ඒ හිම කුමාරිය යනු ඩොමිනික්ගේ ජීවිතයේම කවුරුවත් නොව, පොදුවේ අප සැමගේම අවිඥානයේ හිඳගෙන ඒ අඳුරු ගුහා ජීවිතයට හෙරාටම එළියක් ගෙනෙන සුරූපිනියක් නොවන්නේද? ඈ නියෝජනය කරන්නේ අප සැමගේම එළියට විවර නොවුණු අඳුරු පැතිකඩක තෝන් ලණුව අල්ලාගත්ත එකියකගේ භූමිකාවය.

කංසා මල් පෙත්තක් වාගේ පින්බරය කියා අප කවියා ඈ රුව වනයි. එය ඉතාමත් උත්ප්‍රාසය දනවන්නකි. කංසා සුවයක ඇති මත් බවක් මවනට තරම් හැකියාවක් ඈ සතු බව ඉන් නොකියා කියන අතරම ඒ පිනෙන්ම ඈ පින්බර වූවා සේය. ඩොමිනික්ගේ බොහෝ කවිවල වාගේම මෙහිදීත් පේළියෙන් පේළියට වචනයෙන් වචනයට නිශ්චිත අරුත් ගෙන හැර දැක්වීම ඉතා අපහසු අතරම එසේ කරන්නටද අවැසි නැත. කවිය කියැවීම තුළම මනසේ ඇතිකරන ක්ෂණික සංවේදනා පුළිඟු හා ප්‍රහර්ෂයන් හමුවේ ඒ විඳුම් ඩැහැගන්නවා විනා හැම දෙයක්ම අර්ථ නංවා ගන්නට යාම අනුවණ කමකි. නමුත් කවියක් කියවා විඳගෙන එය තමා විඳගත්තේ කොහොමදැයි තව කෙනෙකුට කියන්නට යාමේදී මතුවන ගැටළුව අවම කරගැනීමේ වුවමනාව මත මම මේ කවිය තෝරාගත්තෙමි. මන්ද මේ කවිය යම් තාක් දුරට ඒ ව්‍යාකූලත්වයන් හෝ අපහසුතාවන්ගෙන් ගෙන් මා මුදවාලන නිසාවෙනි. ඩොමිනික්ගේ බොහෝ කවිවලදී කවිය විඳගෙන ඒ අරුත් ගැන්විය නොහැකි විඳවුම හිතේ රුවාගෙන නිහඬවම සිටීම වඩාත් යෝග්‍ය යැයි මම හඟිමි. පොදුවේ ඩොමිනික්ගේ කවිය යනු රළ නගන අහඹු විඳවුම් ඛණ්ඩවල සාමූහික එකතුවක් යැයි මට හිතේ.

දැන් යළිත් මෙම කවියට හැරෙමු. යථෝක්ත සුරූපනිය යනු කංසා මලක් සේ පින්බර කාත් කවුරුවත් නැති රාත්‍රියක අඳුරු වනපෙතකට සිරියහනක සුව ගෙනෙන්නියකි; ඒ හුදකලා කුටිය තුළ 'සිරියහන' මත විඳියයුතු අතිශය රමණීය පෞද්ගලික අත්දැකමක් බවට මේ අන්තර්ජාල ගනුදෙනුව රූපාන්තරණය කළ තැනැත්තියකි; මේ අඳුරු සාවියම එක මිටට ගෙන රහසිගත ආලෝකයකින් අපේ ජීවිත ආලෝලනය කරන්නියකි; සැබෑවට මුණගැසී කරන සැබෑ ගනුදෙනුවකදී ඇතිවන දහසකුත් අපහසුතා සැණින් මකාලූ, හුදකලා මොහොතක කිසිදු වාස්තවික නියෝජනයකින් තොරව සන්තුෂ්ටියක් හෝ සන්තර්පනයක් ළඟා කරගන්නට අත්උදව් සපයන්නියකි; රහසිගත තථ්‍ය-අතථ්‍ය ප්‍රේමයකි.

කවිය කියවන විට හැඟෙන්නේ මේ සුරූපිනිය ඈත හිම වැටෙන දුර රටක හිඳ හිම සීත මුදාලන හිම වෙලා තියෙන්නේ මෙන්න මේ ඉවසිල්ල නැතිකමෙන් හා මේ අඳුරු අතථ්‍ය ලෝකය තුළ ලැබුණු අසීමිත නිදහස නිසා ඇතිවුණු ප්‍රහර්ෂය දරාගන්නට බැරිකමෙන් හත්පොළේ ගා ගැනීමයි. පුංචි පුංචි හිම කුමරියන් බඳු ප්‍රොෆයිල පිංතූරවලට රැවටී පනහ පැන්නයින් පසු තිරිහන් වුණු අපේ කවි ලියන බාප්පලාට අත්වී ඇත්තේ මේ විපරීත තත්ත්වයම නොවේද? යතුරුපුවරුවෙන් මේ පැත්තට එවන හාදුවක රූපයැති ඉමෝටිකනයක් දිහා හෝ බලාගෙන ස්වයං මෛථුනයෙන් ගෙවා දමන මේ මොහොත කොතරම් අපූරු ප්‍රබන්ධමය මායාවී සන්තුෂ්ටියක් ලබා දෙන්නට සමත් වී ඇත්දැයි යන්න දැන් දැන් ඉඳ හිට තැනක එවන් හත්පොළේ ගාගත්තෙකු හුවමාරු කරගත් පැරණි පණිවුඩ හා උනුන්ගේ පිංතූර තිර පිටපත් වගේ එළිපිට දැකගන්න ලැබෙන කොට වැටහී යන්නේය. දිවා කාලයේ තථ්‍ය ලෝකයේ ඔවුන් විසින් කරනු ලබන බරසාර කතිකාවන් රාත්‍රියේ පුංචි පුංචි හිම කුමරියන් අතින් අයිස් දියවෙන්නා වගේ දියවී යන්නේ ඔවුන්ගේ සරම් කලිසම් පවා තෙත් කරමිනි.

තෙවන කවිය මෙහිම ඊළඟ අදියරයට අපව රැගෙන යයි. පිළිතුරු වචන අතරේ ඉමෝටිකනයක් වෙනුවෙන් නොඉවසිලිවුණු අප කථකයාගේ නොඉවසිල්ල තවත් එක් ඉදිරි පියවරක් වෙනුවෙන් දෑස් දල්වයි. මේ නම් මානව ඉතිහාසය පුරාම නොසිඳෙනා නොසංසිඳෙනා නියාම ධර්මතාවක් බඳුවූ



කුමරියක් බවය. ඒ සියල්ල ඇගේ මුහුණු පොතේ පිංතූර හා හැසිරීම ඔස්සේ අප කවියාගේ මනස මත තැනුණු චිත්‍රයයි; නැතහොත් අප සැවොමගේ අවිඥානයේ ඇඳුණු ගුහා චිත්‍රයයි. ඒ සුන්දරත්වය දකින විට කවි ලියන්නට බැරිවුන්ගේ පන්හිඳෙන් පවා මද කිපුණු කවි පද ගලාගෙන ඒම පුදුමයක් නොවේ. තියෙන කලබලය මොනවට පැහැදිලි කරන්නේ පැටලි පැටලී හදිස්සියේ ගලා එන ඒ වචනයි. යතුරු පුවරුව මත සිතිවිලි එන වේගෙටත් වඩා ඉක්මනින් අකුරු වන්නේ අන්න ඒ හදිස්සියයි; අලෝකයේදී එනම් යථා ලෝකයේදී අපිට කියාගන්න බැරිවුණු එක්තරා හිස් අවකාශයක් ගැන කතා පුවතයි. අප කවියා අතින් මද කිපුණු කවි පද වෑස්සෙද්දී ඔහු ඈත සිටින හිම කුමරියගෙන් අසන්නේ හෙමන්ත සෘතුවේ සුළන් සැර හාදුවක් වෙනුවෙන් අකුරක් අඩු කළේද යන්නයි. මේ මනඃකල්පිත වර්චුවල ලෝකයේ හාදුවක් පවා ඌණනය වී ඇත්තේ යතුරු පුවරුවේ අකුරකටය; බොත්තමකටය; එනම් ඉමෝටිකනයකටය. මේ හැඟුම්බර හුදකලා මොහොතේ අප කවියාට තියෙන හදිස්සියේ ඉක්මනේ තරමට වේගයෙන් ඈ අතින් මේ හාදු හුවමාරු නොවේ. යතුරු පුවරුවෙන් ගලපා එවන්නටත් පෙරම අපේ කවියාගේ නොඉවසිල්ල පොළා පනින්නට පටන් ගෙන ඇත.

ඊයේ පෙරේදා ෆේස්බුකියට රිංගූ මුහුණුපොතේම පදිංචි වූ බොහෝ පනහ පැන්න උදවියටත් දැන් දෙයකි. හේ අසන්නේ ඇගේ කවුළුවෙන් එපිට වැටන හිම කැට ඈ ගතට හිරිගඬු ගෙනාවාද කියාය. ඒ නම් මුසාවකි. එකිනෙකා අතර හුවමාරුවන පැණි පිරුණු වදන් හමුවේ ඈ හැඟීම්බර වී ඇවිස්සී ගත හීගඩු පිපී ඒ දැයි දැනගන්නට අප කථකයාට ඇති වුවමනාව නොවේද ඒ? අනිත් පැත්තට එය අපට ඉඟි කරන්නේ කතකයාටත් හිගඩු පිපී මහා පිපිරුමකට ඔන්න මෙන්න කියා සිටින අවස්ථාවක් ගැන නොවේද? මේ වෙනකොට අකුරු ඔස්සේ හුවමාරු වූ පණිවුඩ වෙබ් කැමරාව ඔස්සේ හුවමාරු වන්නට පටන් අරන් ඇති බව තහවුරු වේ. ඇගේ ගතේ නැගුණු හී ගඩු ගැන ඒ තරම් විශ්වාසනීය ලෙස ප්‍රශ්න කරන්නට තරම් අප කථකයා නිර්භය වන්නේ ඒ ඔසේය. ඈ දෙනෙත්වලට කඳුළු ඇවිත් ඇති බවක් හේ අනතුරුව පවසයි. ඒ සතුටු කඳුළක්ද නැත්නම්, මේ තිරය ඉදිරියේ අසරණ වන දහසකුත් එකක් ජීවිත ගැන උපන් මහානුකම්පාවකින් නැඟුනක් දැයි අපි නොදනිමු. මෙන්න මේ හැඟීම් ගනුදෙනුව ටිකෙන් ටික වෙනත් ඉසව්වක් කරා දැන් පා නගයි. ඔහු ආයාචනා කරන්නේ බිඳෙන් බිඳ ඈ තන පට මුදාලන ලෙසයි. මෙන්න මේ අන්ධකාරය තුළ, එනම් මේ හුදකලා කාමරය තුළ සැබෑ ජීවිතේ කෙළින් කතාකොට විසඳා ලබා ගත නොහුණු දෙයක් අත්

46 පිටට